**උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල බර යන්ත්‍ර ක්‍රියාකරු III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම -2026**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ පවතින පුරප්පාඩු 07 ක් පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2026.08.28 වේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 07 කි.

**01. බඳවා ගැනීමේ සුදුසුකම් :**

1. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යානය පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී එක් වරකදි යටත් පිරිසයින් සිංහල /දෙමළ භාෂාව ඇතුළුව, සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) ක් සමත් වී තිබීම

**2. වෘත්තීය සුදුසුකම්:**

- වෘත්තීයට අදාලව ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) 3 වන මට්ටමේ සහතිකය ලබා තිබීම

  හෝ

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTEP) වෘත්තීයට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම.

  හෝ

- ජාතික තරුණ සේවා සභාවේ ( NYSC ) අදාල එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිම.

  හෝ

- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ( VTA ) වෘත්තීයට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිම.

  හෝ

- ජාතික අධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ( NAITA ) වෘත්තීයට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිම.

  හෝ

- තෘතිය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තීයට අදාලව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකයක් ලබා තිබීම.

  හා

- පෞද්ගලික/කුළී රථ සහ තාර බර හෝණ්ඩර 24 ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබද සහතිකයක් ලබා තිබීම.

**02. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයෙකුම උතුරු මැද පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**03. වෙනත් සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
II. උතුරු මැද පළාත තුල ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
III. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
IV. ඉල්ලුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**04. වැටුප් පරිමාණය :**

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ, III ශ්‍රේණිය සඳහා රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 10/2025 හි PL3 - 2025 අනුව 42780-10X490-10 X540-10 X 590 – 12 X 630 – 66540/= ක වැටුප් පරිමාණය හිමි වේ.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :**

01. සුදුසුකම් පරීක්ෂාව හා ප්‍රායෝගික පරීක්ෂාව මගින්.

1.2 ප්‍රායෝගික පරීක්ෂණය (ප්‍රාථමික ශිල්පීය III ශ්‍රේණියට බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීමේදි අදාල වන ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් නිර්නායකයන් වලට අනුව සිදු කෙරේ.)

(අ) බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුගේ තාක්ෂණික නිපුණතාවය/ශිල්පීය හැකියාව මැන බැලීම ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සිදු කරනු ලැබේ

(ආ) එකී තනතුරට අදාල වන පරිදි ප්‍රශ්ණාවලිය පත්වීම් බලධාරියා විසින් සකස් කරන අතර, අදාල පරීක්ෂණය වාචික පරීක්ෂණයක් ස්වභාවයෙන් සිදු කරනු ලැබේ.

(ඇ) මීට අමතරව යම් බර යන්ත්‍රයක් හෝ උපකරණයක් ප්‍රායෝගිකව ක්‍රියා කරවා බැලීම හෝ බර යන්ත්‍රයක්, උපකරණයක් හෝ බර යන්ත්‍රයක කොටසක් ගලවා සවි කිරීම "ඇ" ඡේදයේ අවශ්‍යතාවය අනුව ප්‍රායෝගික පරීක්ෂණයකට ඇතුළත් කිරීම පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

මෙහිදි නිශ්චිත කාල සීමාවක් තුළදී එම කාල සීමාව තුළ බර යන්ත්‍රය හෝ එහි කොටසක් හෝ උපකරණ ක්‍රියා කරවීම හෝ ගලවා සවි කිරීම පිළිබඳව අයදුම්කරු ක්‍රියාකරන අනු පිළිවෙල හා ශිල්පිය නිපුණතාව ඇගයීමට ලක් කරනු ලැබේ.

(ඈ) ඉහත "අ" හා "ඇ" යටතේ සඳහන් කොටස් දෙකින් එකක් හෝ දෙකම හෝ ප්‍රායෝගික පරීක්ෂණයට ඇතුළත් කිරීම පිළිබඳව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

සටහන: වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් අතරින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු සහ වෘත්තීය පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් කුසලතා අනුපිළිවෙලට පවතින පුරප්පාඩු අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

**06. අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

6.1 මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් නිවැරදිව හා පැහැදිලිව තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතු වේ. A4 ප්‍රමාණයේ කඩදාසි වල අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු අතර, අයදුම්පත සැකසීමේදී A4 කඩදාසියේ දෙපැත්ත ප්‍රයෝජනයට ගත යුතුය.

6.2 නියමිත ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන, අසම්පූර්ණ හා සුදුසුකම් සපුරා නොමැති ,නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ජායා පිටපතක් ළග තබා ගැනීම ප්‍රයොජනවත් විය හැකිය.)

6.3 ඉල්ලුම්පත්‍රයේ ඇති අයදුම්කරුගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියෙකු/ පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක නිලධාරියෙකු හෝ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරණ මාණ්ඩලික නිලධාරියක් විසින් සහතික කරනු ලැබිය යුතුය.

6.4. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින්,ඉදිරිපත් කළ යුතුය.

6.5. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.08.28 දිනට පෙර **"ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දිස්ත්‍රික් ලේකම් පරිශ්‍රය,උතුරු මැද පළාත , අනුරාධපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය.ඉල්ලුම්පත් යොමු කරන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම -2026"** ලෙස පැහැදිලිව සඳහන් කළ යුතුය.

6.6. තැපැල් කිරීමේදි අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ.

**07**. මෙම තනතුරු සඳහා බඳවා ගැනිම හෝ නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව සම්බන්ධ අවසාන තීරණය උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**08**. එසේම මෙම නිවේදනයේ විධි විධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ පැහැදිලි කිරීම් / තීරණය කිරීම් ද උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ඇත.

**09. විශේෂ අවධානය යොමු විය යුතු කරුණු:**

- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන් විසින් මෙම නිවේදනයේ දක්වා ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

- මෙම සම්මුඛ පරික්ෂණය සඳහා ඉදිරිපත් වීමට කිසියම් අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණ වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පසුව හෝ ඕනෑම අවස්ථාවකදි ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවා ගත් පසුව වුවද යම් අපේක්ෂකයෙකු ඉදිරිපත් කළ කිසියම් තොරතුරක් සාවද්‍ය බව සනාථ වුවහොත් ඔහුගේ/ඇයගේ පත්වීම අවලංගු කරනු ලැබේ.

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.
2026.08.07

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**අයදුම්පත**

**<u>උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම - 2026</u>**

1.

1.1 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

1.2 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

1.3 මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

1.4 මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/ දෙමළෙන් අකුරෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

1.5 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

1.6 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

1.7 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.

2.1 අයදුම්කරු ස්ථිරව පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................................

..........................................................................................................................................

2.1. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................

..........................................................................................................................................

2.2. ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :

..........................................................................................................................................

..........................................................................................................................................

2.3. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

..........................................................................................................................................

..........................................................................................................................................

2.4. දැනට රාජ්‍ය සේවයේ නිරත අයෙකු නම් කාර්යාල ලිපිනය..............................................................

..........................................................................................................................................

2.5 දුරකථන අංකය :ජංගම : ................................. කාර්යාලීය : ...............................

2.6උපන් දිනය : වර්ෂය මාසය

| | | | |
|---|---|---|---|
| | | | |

දිනය

| | |
|---|---|
| | |

| | |
|---|---|
| | |

2.7 **2026.08.28** දිනට වයස :

අවුරුදු ☐☐☐☐ මාස ☐☐ දින ☐☐

2.8 ස්ත්‍රී/පුරුෂ භාවය ..........................................................................................................

**3.0 ස්ථිර පදිංචිය පිළිබඳ විස්තර**

3.1 අයදුම් කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය..........................................................................
3.2 පදිංචි කාල සීමාව (වසර)..............................................................................................

**4.0 අධ්‍යාපන සුදුසුකම්**

4.1.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය (සහතික වල ඡායා පිටපත් අමුණන්න)
වර්ෂය ........................... විභාග අංකය..............................................

| අනු අංකය | විෂයය | සාමාර්ථය | අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 01 | | | 07 | | |
| 02 | | | 08 | | |
| 03 | | | 09 | | |
| 04 | | | 10 | | |
| 05 | | | 11 | | |
| 06 | | | 12 | | |

4.1.2 වෘත්තීය සුදුසුකම්..........................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

4.1.3 වෙනත් සුදුසුකම් (සහතික වල ඡායා පිටපත් අමුණන්න)
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

4.1.4. ඔබ සාපරාධි ක්‍රියාවක් සම්බන්ධව අධිකරණයේ වරදකරුවකු ද? නැතිද? යන වග (වරද කරුවකු වී නම් ඒ පිළිබඳ විස්තර) ..........................................................................................................

5 . **අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත්, මා මෙම තනතුරට නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කරමි. එසේම මා කුමන හෝ ආකාරයක විනය දඬුවමක් ලබා නොමැති බවටත්, මේ වන විට ඒ සම්බන්ධව පරීක්ෂණයක් ආරම්භ කර නොමැති බවටත් සහතික වෙමි.

දිනය : .......................... ...................................
අයදුම්කරුගේ අත්සන

**6. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................මහතා/මහත්මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ ඇය .......................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

.......................................
සහතික කරන නිලධාරියාගේ අත්සන
දිනය : ..............................
සහතික කරන නිලධාරියාගේ නම : ..........................................
තනතුර : ..........................................................................
ලිපිනය සහිත නිල මුද්‍රාව

**7. රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයෙහි නියුතු අයදුම් කරුවෙකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා විසින් කළ යුතුය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන................................................................................................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ................................................................ සේවය කරන බව ද, මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බව ද, ඔහු මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව ද සහතික කරමි.

.............................................
දිනය: ....................... ආයතන ප්‍රධානියාගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ආයතන ප්‍රධානියා/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :
තනතුර :
ලිපිනය : (නිල මුද්‍රාව තබන්න)